# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2184/2 - 2020 ජූලි මස 13 වැනි සඳුදා - 2020.07.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ මිරිස්සේ ගම් හේවාගේ ගාමිණී ජයන්ත අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා පෙරියසාමි සුදාහරන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, එච්. අයි. ආර්. හතුරුසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් පෙරියසාමි සුදාහරන්, හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්කර මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**එච්. අයි. ආර්. හතුරුසිංහ,**
තේරීම්භාර නිලධාරි,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව.

2020 ජූලි මස 12 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

07 - 681


1A - G 32475 — 27 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*